# දැහැමිව උපයා දැහැමිව වැය කරමු



# නිපුණතාව 9. 0

## බෞද්ධ ආර්ථික හා රාජ්‍ය පාලන චින්තනය හැදින ගෙන ඒ අන්ව ක්‍රියා කරයි.



# ඉගෙනුම් ඵල

- අංගුත්තර නිකායේ පත්ත කම්ම සූත්‍රයේ දැක්වෙන ප්‍රාප්ත කම්ම හතර පැහැදිලි කරයි.
- උපභාගත් ධනය තමාගේ හා අන්‍යන්ගේ යහපත සඳහා යෙදවිය යුතු බව පිළිගනියි
- පත්තකම්ම සූත්‍රයේ ප්‍රාප්ත කම්ම රූප සටහන් මගින් නිරූපනය කරයි
- තමා උපයන සම්පත් අර්ථ වත්ව පරිහරණය
- අරපිරි මැස්මෙන් පරිභොජනය නරයි.

# නිපුණතා මට්ටම

## 11.9.2 උපයා ගත් ධනය තමාගේ හා අන්‍යන්ගේ යහපත පිණිස යෙදවිය යුතු බව දැන ඊට අනුගතව ක්‍රියා කරයි.



# අරමුණු

අංගුත්තර නිකායේ පත්ත කම්ම සූත්‍රයේ ප්‍රාප්ත කර්මවලට අනුව උපයා ගත් ධනය පරිහරණය කිරීමට සිසුනට මග පෙන්වීම.

සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ චතුක්ක නිපාතයේ පත්ත කම්ම සූත්‍රය ඇතුලත් වේ මෙය අනේපිඬු හෙවත් සුදත්ත සිටුවරයා උදෙසා දේශනා කොට ඇත.



11 ශ්‍රේණි 21 පාඩම බුද්ධ ධර්මය

පත්ත → සුදුසු , යෝග්‍ය
කම්ම → ක්‍රියාව

පත්ත කම්ම → සුදුසු ක්‍රියාව හෙවත් කළ යුත්ත



11 ශ්‍රේණි

21 පාඩම

බුද්ධ ධර්මය



හරි හම්බ කරපු දේවල් දුක් මහන්සියෙන්
දනට පිනට - ගෙදර දොරට
දුන්නේ මං - හිතේ මනාපෙන්...
දෑත දෙපය ඇති දැඩි කළ
මතු බුදු වන මවුපියන්ට
එකම මවට අම්මෙ කියූ
එක පවුලේ සොහොයුරන්ට
හරි හම්බ කරපු දේවල්...
ජීවිතයම දුකයි කියා
මහණ වෙච්ච යතිවරුන්ට
නැතිබැරිකම උතුරාගිය
මග හමුවන මිනිස්සුන්ට
හරි හම්බ කරපු දේවල්...







11 ශ්‍රේණි 21 පාඩම බුද්ධ ධර්මය

# උපයාගත් ධනය ආකාර සතරකින් පරිභෝජනය කළ යුතුය

01. තමා සැප විඳී, සතුටු වෙයි. සිය මවුපියන් ද මැනැවින් සැපවත් කරයි සතුටු කරයි. අඹු දරුවන් ද සේවක ජනයා ද සැපවත් කරයි; සතුටු කරයි

02 උත්සාහයෙන් හා වීර්යයෙන්, දැතේ ශක්තියෙන්, දහඩිය වගුරුවා දැහැමි ව උපයා ගන්නා ධනය ආරක්ෂා කර ගැනීම

03 පංච බලි නම් වූ යුතුකම් පහක් ඉටු කළ යුතු

04 මහණ බමුණන්ට දන් දීම පූජා පැවැත්වීමයි



# පංච බලි

01 ඥාති බලි - ඥාතීන්ට සංග්‍රහ කිරීම
02 අතිථි බලි -. ආගන්තුක සත්කාර
03 පුබ්බ පේත බලි -. මියගිය අය වෙනුවෙන්
04 රාජ බලි -. රජුට අයබදු ගෙවීම
05 දෙවතා බලි -. දෙවියන් උදේසා කරණ පූජා

11 ශ්‍රේණි 21 පාඩම බුද්ධ ධර්මය





ගිහි බෞද්ධයකුගේ ධන පරිහරණය

1

ආත්මාර්ථය හා පරාර්ථය සැලසීම

2

විවිධ උවදුරුවලින් ආරක්ෂා කර ගැනීම

3

පංච බලි නම් වූ යුතුකම් ඉටු කිරීම

4

පැවිදි උතුමන්ට දානාදියෙන් සංග්‍රහ





11 ශ්‍රේණි    21 පාඩම    බුද්ධ ධර්මය






## පුහුණුවට

දානඤ්ච ධම්ම චරියාච
ඤාතකානඤ්ච සංඝහෝ
අනවජ්ජානි කම්මානි
ඒතං මංගල මුත්තමං
(මංගල සූත්‍රය)

දන් දීම, ධර්මයෙහි හැසිරීම, නෑයන්ට සංග්‍රහ කිරීම, නිවැරැදි කර්මාන්ත කිරීම

මංගල කරුණු හෙවත් පුද්ගල දියුණුවට හේතු වන පිළිවෙත් වන්නේ ය.

බුදු දහම ගිහියකු විසින් ධනය කෙසේ පරිහරණය කළ යුතු ද යි පැහැදිලි කරමින් විවිධ අවස්ථාවල දී නොයෙකුත් උපදෙස් ලබා දී ඇත. ඒ අතර අනාථ පිණ්ඩික සිටුතුමාට දේශනා කොට ඇති ප්‍රාප්ත කර්ම සතර ඉතා වැදගත් යි එමගින් පුද්ගලයකුට ආත්මාර්ථය මෙන්ම පරාර්ථය ද සැලකිල්ලට ගනිමින් මනා කළමනාකරණයකින් ඵලදායක ලෙස ධනය පරිහරණය කිරීමට උගන්වා තිබේ.

# ක්‍රියාකාරකම

1. පත්තකම්ම හෙවත් ප්‍රාප්ත කර්ම මොනවා දැයි හඳුන්වන්න.

පිළිතුර

1. තමා සැප විඳී, සතුටු වෙයි. සිය මවුපියන් ද මැනැවින් සැපවත් කරයි; සතුටු කරයි. අඹු දරුවන් ද සේවක ජනයා ද සැපවත් කරයි; සතුටු කරයි.

## ක්‍රියාකාරකම

2. පත්තකම්ම සූත්‍රයට අනුව උපයන ධනයෙන් ආත්මාර්ථය මෙන් ම පරාර්ථය ද සමබර ව සැලසෙන අයුරු පැහැදිලි කරන්න

## පිළිතුර

තම සැපත සතුට උදාකර ගැනීම යනු ආත්මාර්ථය සලසා ගැනීම ය. මවුපියන් ඇතුළු සෙසු ආශ්‍රිතයන්ට සැපත සතුට උදා කිරීම යනු පරාර්ථය සැලසීමයි. මෙසේ බුදු දහම ආත්මාර්ථය මෙන්ම පරාර්ථය ද සමබර ව උගන්වයි. අසීමිත තණ්හාවෙන් ආත්මාර්ථකාමී ව කටයුතු කරන තැනැත්තා අදැහැමි ක්‍රියාවන්ට ද යොමු විය හැකි ය. හෙතෙම කෙසේ හෝ තම සුවසෙත සොයා යාමට පෙළඹේ. එබැවින් ආත්මාර්ථය සමග ම පරාර්ථය ද සලසා ගන්නට උපයන්නා ක්‍රියා කළ යුතු ය.